# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1994 අංක 9 දරන

# ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 මැයි 26 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී**

---

1994 මැයි මස 27 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : රු. 1.65 යි. තැපැල් ගාස්තුව : රු. 1.55

## 1994 අංක 9 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1994 මැයි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 95/92

**1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1994 අංක 9 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1990 අංක 2 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) ගෙවීම් පැහැර හැර ඇතැයි කියන මුදල රුපියල් එක් ලක්ෂ පනස් දහසකට අඩුවන අවස්ථාවක, එම ණය අයකර ගැනීම සඳහා මේ පනත මගින් දක්වා ඇති කාර්ය පටිපාටිය ප්‍රකාර යම් ආයතනයක් විසින් කිසිම නඩුවක් නොපැවරිය යුතු ය.";

(2) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"ණයක් ආපසු අයකර ගැනීම සඳහා ණය දෙන ආයතන විසින් නඩු පැවරීම.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) නඩු පවරන ආයතනය විසින් පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන විට, හිමිකම් පෑ ඇති මුදල විත්තිකරුගෙන් ආයතනයට නීත්‍යානුකූලව අයවිය යුතු බවට වූ දිවුරුම් පත්‍රයක්, නයිසයි තීන්දු ප්‍රකාශයේ කෙටුම්පතක්, නයිසයි තීන්දු ප්‍රකාශය සඳහා සහ එය භාරදීම සඳහා අවශ්‍ය මුද්දර පැමිණිල්ල සමග ඉදිරිපත් කළ යුතු අතර, ඊට අතිරේකව, නඩු පැවරීමට මුල් වූ හෝ ආයතනය විසින් විශ්වාසය තබන හෝ පැමිණිල්ලේ, දිවුරුම් පත්‍රයේ, සාධන පත්‍රයේ, ගිවිසුමේ හෝ ලේඛනයේ නඩුවේ විත්තිකරුවන්ගේ සංඛ්‍යාවට සමාන පිටපත් සංඛ්‍යාවක් ද ඉදිරිපත් කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "පැමිණිල්ලේ සඳහන් ගණනට" යන වචන වෙනුවට "පැමිණිල්ලෙහි අයැද ඇති ගණනට" යන වචන ආදේශ කිරීමෙන් ;

2—ඩී 02698—5,405 (93/05)

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "විය යුතුය." යන වචන වෙනුවට, "විය යුතු අතර, ඉන් පසු අධිකරණයේ පෙනී සිටීම සඳහා සහ ඒ නයිසයි තීන්දු ප්‍රකාශයට විරුද්ධව හේතු දැක්වීම සඳහා, අධිකරණය විසින් විත්තිකරුට වැඩිපුර කාලයක් නොදිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (4) වන වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (1) වන උපවගන්තිය යටතේ ආයතනය විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් පත්‍රය, නඩු නිමිත්තේ කරුණු පිළිබඳව පෞද්ගලික දැනීමක් ඇත්තා වූ ඒ ආයතනයේ ප්‍රධාන නිලධරයකු විසින් ඉදිරිපත් කළ යුතු ය. තව ද, ඒ තැනැත්තා විසින්, ඒ දිවුරුම් පත්‍රයේ ඇතුළත් කරුණු තමාගේම පෞද්ගලික දැනීම මත කියා සිටින බව දිවුරා හෝ සහතික කොට ඒ දිවුරුම් පත්‍රයෙන් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, එහි ඇතුළත් විෂය කරුණු පිළිබඳව, විනිශ්චයකාරවරයාගේ අභිමතය පරිදි පරීක්ෂා කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය." ;

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(6) ඒ වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"නඩු පැවරීමට මුල් කර ගන්නා සාධන පත්‍රයේ, ගිවිසුමේ හෝ ලේඛනයේ පිටපත් ඉදිරිපත් කළ යුතු බව.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම, සාමාන්‍යයෙන් ලියාපදිංචි තැපෑලෙන් කළ යුතු බව.

**5.** (1) 5ආ වගන්තියේ විධිවිධානවලට යටත්ව නයිසයි තීන්දු ප්‍රකාශය සාමාන්‍යයෙන් තමා වෙත අධිකරණ නියෝග භාර දෙනු ලැබිය යුතු ලිපිනය වශයෙන් විත්තිකරු විසින් ආයතනය වෙත දෙන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් විත්තිකරු වෙත සාමාන්‍යයෙන් භාර දිය යුතු ය.

(2) විත්තිකරු රජයේ නිලධරයකු වන අවස්ථාවක, අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, ලියාපදිංචි තැපෑලෙන් නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත යැවීමට අමතරව, විත්තිකරු සේවයෙහි නියුක්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත ලියාපදිංචි තැපෑලෙන් නයිසයි තීන්දු ප්‍රකාශයේ පිටපත් දෙකක් ද ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, නයිසයි තීන්දු ප්‍රකාශයේ පිටපතක් විත්තිකරු වෙත පෞද්ගලිකවම භාරදීමට සැලැස්වීම සහ නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු භාරගත් බවට වූ පිළිගැනීමේ සටහනක් සමඟ හෝ නයිසයි තීන්දු

ප්‍රකාශය භාර දුන් බවට, භාරදීම කළ තැනැත්තා විසින් පිටසන් කර අත්සන් කළ සහ, භාර දීම කරන ලද්දේ පෞද්ගලිකව දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින්ම නොවේ නම්, දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් අනු අත්සන් කළ ප්‍රකාශයක් සහිතව, නයිසයි තීන්දු ප්‍රකාශයේ අනෙක් පිටපත අධිකරණය වෙත වහාම ආපසු එවීම, දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ කාර්යය විය යුතු ය.

(3) විත්තිකරු රජයේ නිලධරයකු නොවන්නාවූ සහ වෙනත් තැනැත්තකුගේ සේවා නියුක්තියෙහි සේවයේ යෙදී සිටින්නා වූ අවස්ථාවක, අධිකරණය විසින් ස්වකීය අභිමතය පරිදි, විත්තිකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් නයිසයි තීන්දු ප්‍රකාශය යැවීමට අමතරව, නයිසයි තීන්දු ප්‍රකාශයේ පිටපත් දෙකක් විත්තිකරුගේ සේවා යෝජකට ලැබෙන සේ ඔහුගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානය වෙත හෝ සේවා යෝජකයා සමාගමක් හෝ සංස්ථාවක් වන අවස්ථාවක, සමාගමේ හෝ සංස්ථාවේ ලේකම්, කළමනාකරු හෝ වෙනත් එවැනි යම් නිලධරයකු වෙත යවනු ලැබිය හැකි අතර, නයිසයි තීන්දු ප්‍රකාශයේ පිටපතක් විත්තිකරු වෙත පෞද්ගලිකව භාරදීමට සැලැස්වීම සහ නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු භාරගත් බවට වූ පිළිගැනීමේ සටහනක් සමඟ හෝ නයිසයි තීන්දු ප්‍රකාශය භාර දුන් බවට, භාරදීම කළ තැනැත්තා විසින් පිටසන් කර අත්සන් කළ සහ භාරදීම කරන ලද්දේ පෞද්ගලිකව විත්තිකරුගේ සේවායෝජක විසින්ම නොවේ නම්, ඒ සේවා යෝජක විසින් අනු අත්සන් කළ ප්‍රකාශයක් සහිතව, නයිසයි තීන්දු ප්‍රකාශයේ අනෙක් පිටපත අධිකරණය වෙත වහාම ආපසු එවීම, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවා යෝජකගේ හෝ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(4) මේ වගන්තියේ "දෙපාර්තමේන්තු ප්‍රධානයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා යුද හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ යම් ඒකකයක සාමාජිකයකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ ඒකකයේ අණදෙන නිලධරයා අදහස් වේ;

(ආ) පළාත් සභාවක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ පළාත් සභාවේ ලේකම් අදහස් වේ ;

(ඇ) පළාත් රජයේ සේවයේ සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ විට, ඒ තැනැත්තා සේවයෙහි නියුක්තව ඇත්තා වූ දෙපාර්ත මේන්තුවේ ප්‍රධානයා අදහස් වේ ;

(ඈ) පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් භාවිතා කරනු ලැබූ විට, පළාත් පාලන ආයතනය මහ නගර සභාවක් නම්, සභාවේ නාගරික කොමසාරිස් අදහස් වන අතර, පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම්, ඒ සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපති අදහස් වේ ;

(ඉ) වෙනත් යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් භාවිතා කරනු ලැබූ විට, ඒ තැනැත්තා සේවයෙහි නියුක්ත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ, 5ආ සහ 5ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

5. 5 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ, 5ආ සහ 5ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතුය :—

"නයිසයි ප්‍රකාශය භාර දුන් බවට සාක්ෂි

5අ. (1) 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නයිසයි නින්දු ප්‍රකාශයක් යම් විත්තිකරුවකු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබූ අවස්ථාවක, නින්දු ප්‍රකාශය යැවූ ලියාපදිංචි ලිපිය භාරදීමේ සටහන විත්තිකරු වෙත ඒ නයිසයි නින්දු ප්‍රකාශය භාරදීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.

(2) 5 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ විත්තිකරුවකු, වෙත නයිසයි නින්දු ප්‍රකාශයක් භාර දෙනු ලැබූ අවස්ථාවක, නයිසයි නින්දු ප්‍රකාශය විත්තිකරු භාරගත් බවට වූ පිළිගැනීමේ සටහනක් හෝ නින්දු ප්‍රකාශයේ අනුපිටපතෙහි පිටසන් කරන ලද භාරදුන් බවට වූ ප්‍රකාශයක් විත්තිකරු වෙත ඒ නයිසයි නින්දු ප්‍රකාශය භාරදීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.

(3) විත්තිකරු වෙත නයිසයි නිත්දු ප්‍රකාශය ලියාපදිංචි තැපෑලෙන් යවා ඇති නමුදු, ඒ සම්බන්ධයෙන් වන භාරදීමේ සටහන ලබාගෙන නොමැති බව ට අධිකරණය සෑහීමට පත්වූ අවස්ථාවක, විත්තිකරු සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ හෝ සමාගමක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඒ සමාගමේ හෝ සංස්ථාවේ සාමාන්‍යයෙන් ව්‍යාපාරික කටයුතු කරනු ලබන ස්ථානයේ හෝ කාර්යාලයේ කිසියම් ප්‍රකට ස්ථානයක නයිසයි නිත්දු ප්‍රකාශය ඇලවීමට, පිස්කල්ට හෝ ඒ සඳහා අධිකරණය විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකුට හෝ අධිකරණය විසින් බලය දෙනු ලැබිය යුතු අතර, එබඳු අවස්ථාවක දී නයිසයි නිත්දු ප්‍රකාශය විත්තිකරු වෙත යථාපරිදි භාර දුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) 5 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ විත්තිකරු වෙත නයිසයි නිත්දු ප්‍රකාශය ලියාපදිංචි තැපෑලෙන් යවා ඇති නමුදු, විත්තිකරු එය භාරගත් බවට වූ පිළිගැනීමේ සටහනක් හෝ එය විත්තිකරු වෙත භාරදුන් බවට වූ ප්‍රකාශයක් නොලැබී ඇති බවට අධිකරණය සෑහීමට පත්වූ අවස්ථාවක, විත්තිකරු සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ කිසියම් ප්‍රකට ස්ථානයක නයිසයි නිත්දු ප්‍රකාශය ඇලවීමට, පිස්කල්ට හෝ ඒ සඳහා අධිකරණය විසින් බලය දෙන ලද වෙනත් නිලධරයකුට හෝ අධිකරණය විසින් බලය දිය යුතු අතර, එබඳු අවස්ථාවකදී, නයිසයි නිත්දු ප්‍රකාශය විත්තිකරු වෙත යථා පරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකරණ නියෝග භාරදිය නිලධරයකු මගින් නයිසයි නිත්දු ප්‍රකාශය භාරදිය හැකි බව.

5ආ. (1) නයිසයි නිත්දු ප්‍රකාශය සටහන් කරනු ලැබූ විගසම ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, අධිකරණය විසින්, ස්වකීය අභිමතය පරිදි, නයිසයි නිත්දු ප්‍රකාශය ලියාපදිංචි තැපෑලෙන් යැවීම වෙනුවට එය අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් විත්තිකරු වෙත පුද්ගලිකවම ඉදිරිපත් කිරීමෙන් හෝ ගෙන ගොස් දීමෙන් භාර දිය යුතු යයි අණකරනු ලැබිය හැකි ය.

(2) නිසි උද්යෝගය ක්‍රියාත්මක කිරීමෙන් (1) වන උපවගන්තියේ සඳහන් භාරදීම කළ නොහැකි නම්, විත්තිකරු සාමාන්‍යයෙන් වාසය කරන නිවසේ හෝ සංස්ථාවක් හෝ සමාගමක් සම්බන්ධයෙන් වන විට, ඒ සංස්ථාවේ හෝ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරනු ලබන ස්ථානයේ හෝ කාර්යාලයේ කිසියම් ප්‍රකට ස්ථානයක, අධිකරණ නියෝග භාරදෙන නිලධරයා විසින්

නයිසයි තීන්දු ප්‍රකාශය අලවනු ලැබිය යුතු අතර, එබඳු සෑම අවස්ථාවකදීම නයිසයි තීන්දු ප්‍රකාශය විත්තිකරු වෙත යථාපරිදි භාරදුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) විත්තිකරු වෙත හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු වෙත නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීමෙන් පසු, ඒ නයිසයි තීන්දු ප්‍රකාශයේ මුල් පිටපතේ එය භාරදුන් බවට පිළිගැනීමක් වශයෙන් ඒ විත්තිකරුගේ හෝ තැනැත්තාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම හෝ තබන ලෙස ඉල්ලා සිටීම අධිකරණ නියෝග භාර දෙන නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(4) අධිකරණ නියෝග භාරදෙන නිලධරයා විසින්, නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් ආකාරය, තැනැත්තා, ස්ථානය හා ඒ තැනැත්තා හඳුනා ගැනීමට අදාළ වෙනත් විස්තර සහ ඒ තැනැත්තාට නයිසයි තීන්දු ප්‍රකාශය භාරදුන් දිනය හා වේලාව ද සවිස්තරව දැක්වෙන අණපත්‍රය අධිකරණය වෙත ආපසු භාර දෙනු ලැබිය යුතු අතර, ඒ නයිසයි තීන්දු ප්‍රකාශයේ මුල් පිටපතේ, නයිසයි තීන්දු ප්‍රකාශය භාරගත් තැනැත්තා විසින්, ඒ නයිසයි තීන්දු ප්‍රකාශය භාරගත් බවට ඔහුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම තැබුවේ ද, යන බව, හෝ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම තැබීමට ප්‍රතික්ෂේප කළේ ය යන බව ද වාර්තාවේ සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, මුල් පිටපත මත අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ හෝ ඒ දෙකම හෝ තැබීමට ප්‍රතික්ෂේප කිරීමෙන් නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම නිෂ්ඵල නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා—

"අධිකරණ නියෝග භාරදෙන නිලධරයා" යන්නෙන්, අධිකරණයේ පිස්කල් නිලධරයා හෝ නයිසයි තීන්දු ප්‍රකාශය භාරදෙනු ලබන්නේ යම් අධිකරණ බල ප්‍රදේශයක ප්‍රාදේශීය සීමා තුළද ඒ ඇතුළත සමාන අධිකරණ බලය ඇති අධිකරණයක පිස්කල් හෝ අසාමාන්‍ය අවස්ථාවන්හි දී නයිසයි තීන්දු ප්‍රකාශය භාරදීම සඳහා අධිකරණය විසින් විශේෂයෙන් බලය දෙන ලද නිලධරයෙක් හෝ යම් අධිකරණයක යම් අධිකරණ නියෝග භාර දෙන නිලධරයෙක් හෝ ග්‍රාම නිලධාරී හෝ පෞද්ගලික අධිකරණ නියෝග භාර දෙන තැනැත්තෙක් හෝ අදහස් වේ;

“පෞද්ගලික අධිකරණ නියෝග භාර දෙන තැනැත්තා” යන්නෙන්, නීතිඥවරයකු විසින් හෝ යම් ආයතනයක් විසින් හෝ සේවයෙහි නියුක්ත කරවන ලද්දා වූ සහ පිස්කල් විසින් යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කරන ලද්දාවූ තැනැත්තෙක් අදහස් වේ.

අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින් භාරදීම කරනු ලබන අවස්ථාවක, භාරදීම කළ යුතු ආකාරය.

5ඈ. නයිසසි තීන්දු ප්‍රකාශයක් අධිකරණ නියෝග භාරදෙන නිලධරයකු මගින්, පෞද්ගලිකවම භාරදිය යුතු යයි ආඥා කරනු ලබන අවස්ථාවක, එම නයිසසි තීන්දු ප්‍රකාශය නිකුත් කරනු ලබන අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සීමාවෙන් බැහැරව නයිසසි තීන්දු ප්‍රකාශයක් භාර දීමට නියමිතව ඇති විටකදී ඒ තීන්දු ප්‍රකාශය ඒ අධිකරණය විසින් විත්තිකරු වාසය කරතැයි විශ්වාස කරනු ලබන අධිකරණ බල සීමාව ඇතුළත වූ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ඒ නයිසසි තීන්දු ප්‍රකාශය ශ්‍රී ලංකාවේ කවර වූ හෝ කොට්ඨාසයක දී භාරදෙනු ලැබිය හැකි ය. තවද මේ පනතේ විධිවිධානවලට අනුකූලව නයිසසි තීන්දු ප්‍රකාශය යථා පරිදි විත්තිකරු වෙත භාරදීම සඳහා කටයුතු සැලැස්වීම අවසන් වරට සඳහන් කරන ලද අධිකරණයේ කාර්ය විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

“(2) පැමිණිලිකරුගේ හිමිකම් පෑම සම්බන්ධයෙන් නිශ්චිතවම ක්‍රියා කෙරෙන්නා වූ ද හිමිකම් පෑමේ විත්තිවාචකය සහ එය සනාථ කිරීම සඳහා විශ්වාසය තබන කරුණු පිළිබඳ පැහැදිලි හා සංක්ෂිප්ත ප්‍රකාශයක් කෙරෙන්නා වූ ද දිවුරුම් පත්‍රයක් මගින් සනාථ වන, පෙනී සිටීම හා හේතු දැක්වීම සඳහා අවසර පතන ඉල්ලීමක් විත්තිකරු විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, සහ කරුණු සැලකිරීමේ අවස්ථාවක් විත්තිකරුට සලස්වා දීමෙන් පසුව පහත දැක්වෙන කුමන හෝ අවස්ථාවකදී පෙනී සිටීම සඳහා සහ නයිසසි තීන්දු ප්‍රකාශයට එරෙහිව හේතු දැක්වීම සඳහා අධිකරණය විසින් අවසර දෙනු ලැබිය යුතු ය :—

(අ) නයිසසි තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල් ප්‍රමාණය විත්තිකරු විසින් අධිකරණයට ගෙවූ විට ; හෝ

(ආ) නයිසයි නින්දු ප්‍රකාශය නියත නින්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබූවහොත්, ඒ නයිසයි නින්දු ප්‍රකාශයේ සඳහන් මුදල් ප්‍රමාණය පියවීම සඳහා යුක්ති සහගත සහ ප්‍රමාණවත් ලෙස අධිකරණයට පෙනියන යම් ඇපයක් විත්තිකරු විසින් සපයනු ලැබූ විට ; හෝ

(ඇ) බැලූ බැල්මට පිළිගත හැකි විත්ති වාචකයක් ඇතැයි හෙළි කරන දිවුරුම් පත්‍රයේ අන්තර්ගතයන් පිළිබඳව අධිකරණය සෑහීමට පත් වූ විට සහ ඇප හෝ විසඳිය යුතු ප්‍රශ්න සකස් කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයෙන් හෝ සුදුසුයයි අධිකරණය සිතන නියමයන් මත.";

(2) ඒ වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

(3) පෙනී සිටීම සහ හේතු දැක්වීමට විත්තිකරු අපොහොසත් වන්නා වූ හෝ පෙනී සිටීමෙන් පසු හේතු දැක්වීම සඳහා වූ ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලද්දා වූ අවස්ථාවක, අධිකරණය විසින් නයිසයි නින්දු ප්‍රකාශය නියත නින්දු ප්‍රකාශයක් බවට පත් කරනු ලැබිය යුතුය. මේ කාර්යය සඳහා විනිශ්චයකාරවරයා විසින් නයිසයි නින්දු ප්‍රකාශයෙහි "නයිසයි නින්දු ප්‍රකාශය නියත නින්දු ප්‍රකාශයක් බවට පත් කරන ලදී." යනුවෙන් (හෝ ඒ සමාන අර්ථය ඇති වචන වලින්) පිටසනක් කර එහි දිනය යොදා අත්සන් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, නයිසයි නින්දු ප්‍රකාශයක්, එහි වෙන වෙනම කොටස් ඇතුළත් වන්නේ නම්, කොටස් වශයෙන් නිදහස් කරනු ලැබිය හැකි අතර, කොටස් වශයෙන් නියත බවට පත් කරනු ලැබිය හැකි ය. තවද, මෙහි පනවන ලද කිසිවකින්, නයිසයි නින්දු ප්‍රකාශයක් පදනම් කරගෙන පැමිණිලිකරුගේ සහ විත්තිකරුගේ කැමැත්ත ඇතිව යම් ආඥාවක් කිරීම වළක්වාලනු ලැබිය නොහැකිය.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.**

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 6අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතුය :—

"නයිසයි නින්දු ප්‍රකාශයක් නියත බවට පත් කෙරේනා ආඥාව අභියාචනය කළ නොහැකි ආඥාවක් නමුත්, ඉවත ලනු ලැබිය හැකි බව.

6අ. (1) විත්තිකරුගේ නොපැමිණීම හේතු කොට ගෙන 6 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නියත බවට පත් කෙරුණු නයිසයි නින්දු ප්‍රකාශයට එරෙහිව විත්තිකරුවකු විසින් කිසිම අභියාචනයක් ඉදිරිපත් නොකළ යුතු නමුත්, නයිසයි නින්දු ප්‍රකාශය භාර දීමෙන් පසුව අනතුරක් හෝ අභාග්‍යයක් නිසා යම් ඉල්ලුම්කරුවකු පෙනී සිටීමෙන් වළක්වාලීම හේතුකොට

ගෙන හෝ ඒ නයිසයි තීන්දු ප්‍රකාශය ඔහුට භාර නොදීම හේතු කොටගෙන හෝ ඒ නයිසයි තීන්දු ප්‍රකාශය ඉවත් කිරීම සඳහා, ඒ නියත ආඥාව කරන ලද්දේ යම් විත්තිකරුවකුට විරුද්ධවද ඒ විත්තිකරු විසින් නියත තීන්දු ප්‍රකාශය ඇතුළත් කර යම් යුක්තිසහගත කාල සීමාවක් ඇතුළත ලඝු කාර්ය පටිපාටිය මගින් කරන ලද ඉල්ලීමක් පිළිගැනීමේ නිසි බලය අධිකරණයට ඇත්තේය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද්දේ යම් හේතුවක් මත ද ඒ හේතුව පැමිණිලිකරුට එරෙහිව අධිකරණය සෑහීමට පත්වන අයුරු යථාපරිදි තහවුරු කරනු ලැබ ඇති අවස්ථාවක, ඉල්ලුම්කරු වෙත පැනවීමට යුක්තිසහගත සහ නිරවද්‍ය යයි අධිකරණය සලකන යම් නියම හා කොන්දේසි මත නියත තීන්දු ප්‍රකාශය අධිකරණය විසින් ඉවත ලනු ලැබිය හැකි අතර, නියත තීන්දු ප්‍රකාශය එසේ ඉවත ලෑමෙන් පසු මේ පනතේ 7 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කාරණය විභාග කර, නිශ්චය කිරීමේ කටයුතු අධිකරණය විසින් කරගෙන යා යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් විත්තිකරුවකු විසින් ලඝු කාර්ය පරිපාටියක් මගින් ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටිය මගින් කරනු ලබන ඉල්ලීම්වලට අදාළ විධිවිධාන, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ "384, 385, 386, 387, 388, 389, 390 සහ 391 යන වගන්තිවල" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "384 වන, 385 වන, 386 වන, 387 වන, 390 වන සහ 391 වන, වගන්තිවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

"ඉදිරිපත් කරන ලද ලේඛනවල මුල් පිටපත් පරීක්ෂා කිරීම සඳහා ලබා දිය යුතුයයි අධිකරණය විසින් අණ කළ හැකි බව.

8. මේ පනත යටතේ වූ යම් නඩු කටයුත්තක දී, පැමිණිල්ල සමග ඉදිරිපත් කරන ලද්දා වූ හෝ නඩුවට පදනම් කරගෙන ඇත්තා වූ සාධන පත්‍රයේ ගිවිසුමේ හෝ වෙනත් ලේඛනයේ මුල් පිටපත, ඒ නඩුව අධිකරණයේ දී සනාථ කරනු ලබන විට, අධිකරණය විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා ලබා දිය යුතු යයි අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි අතර, ඒ සාධන පත්‍රය, ගිවිසුම හෝ ලේඛනය සිවිල් නඩු විධාන සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන් වුවද, ඒ පරීක්ෂණයෙන් පසුව පැමිණිලිකරු වෙත ආපසු යැවිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වන්දි ප්‍රදානය.

11. (1) මේ පනත යටතේ පවරන ලද නඩුවක දී සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක්, අදාළ යම් කරුණු ඔනෑකමින්ම යටපත් කිරීමෙන් හෝ හෙළි නොකිරීමෙන් ලබා ගන්නා ලදැයි අධිකරණය යට පෙනී යන අවස්ථාවක, හෝ නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කිරීමෙන් පසුව, නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කර නඩුව නිෂ්ප්‍රභ කරනු ලැබුව හොත්, හෝ නයිසයි තීන්දු ප්‍රකාශය ඇතුළත් කරනු ලැබුවේ යම් පාර්ශ්වකරුවකුට එරෙහිවද ඒ පාර්ශ්වකරුගේ ඉල්ලීම මත ඒ නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කිරීම සම්බන්ධයෙන් ඒ පාර්ශ්ව කරුට වැයවූ වියදම් හෝ සිදුවූ හානිය හෝ වෙනුවෙන් සාධාරණ යයි අධිකරණය සලකන යම් වන්දි මුදලක් අධිකරණය විසින් ඒ නඩුවේදීම ඒ තීන්දු ප්‍රකාශය ලබාගත් ආයතනයට එරෙහිව ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, මේ උපවගන්තිය යටතේ කරනු ලබන යම් ප්‍රදානයක් නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කිරීම සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා වූ යම් නඩුවක් වළක්වා ලන්නේ ය.

(2) මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක් නිෂ්ප්‍රභ කර ඇත්තේ වුවද, ඒ නඩුවේදී සටහන් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක් සම්බන්ධ යෙන් (1) වන උපවගන්තිය යටතේ වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථා වක ඒ ඉල්ලීම සම්බන්ධයෙන් තීරණයකට එළඹෙනතුරු, එසේ නිෂ්ප්‍රභ කරන ලද නඩුව පවත්නා ලෙස සලකනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"නඩුව පවත්වා ගෙන යාම. [illegible]

12. නයිසයි තීන්දු ප්‍රකාශයට පිළිතුරු වශයෙන් විත්තිකරු අධිකරණයේ පෙනී සිට, නයිසයි තීන්දු ප්‍රකාශය විවාදයට ලක් නොකරන්නේ නමුදු, වගකීම පිළිගෙන ණය වාරික වලින් පියවීමට ආයාචනය කරන අවස්ථාවක අධිකරණය විසින් නඩුවේ පාර්ශ්වකරුවන් දෙදෙනාගේම අනුමතය ඇතිව ඒ කරුණ පිළිබඳව නඩු වාර්තාවෙහි සටහන් කිරීමෙන් පසුව, තීන්දු ප්‍රකාශය නියත කරනු ලැබිය යුතු ය.

එසේ යමර්ථයකට පත් කිරීම, සමර්ථ නියමයන් අතුරෙන් යම් නියමයක් කඩ වන සේ විත්තිකරු ක්‍රියාකරතොත් මිස, තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීම නැවැත්වීමේ නඩු කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය. විත්තිකරු එසේ ක්‍රියා කළහොත් තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කරවා ගැනීමට ආයතනයට හිමිකම් තිබිය යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නියත තීන්දු ප්‍රකාශයක් රිට් ආඥාවක් ලෙස සැළකිය යුතු බව.

13. (1) මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක දී සටහන කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත බවට පත් කරනු ලබන අවස්ථාවක, එය අධිකරණයේ ආඥාවලට යටත්ව (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225(3) වන වගන්තිය ප්‍රකාර පිස්කල් වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාවක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, එය ක්‍රියාවේ යෙදවීම නතර නො කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාව, නයිසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කළ දිනයේ සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ රිට් ආඥා ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් නියමිත ආකාරයට එය ක්‍රියාවේ යෙදවීම පිස්කල්ගේ කාර්යය විය යුතුය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "එම ප්‍රතිරෝධය පෑම පිළිබඳව අධිකරණයට වාර්තා කළ යුතු අතර," යන වචන වෙනුවට, "ක්‍රියාත්මක කිරීමෙන් දින දාහතරක් ඇතුළත එම ප්‍රතිරෝධය පෑම පිළිබඳව අධිකරණයට වාර්තා කළ යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතින් සහ (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය මගින් නියමිත දණ්ඩනවලට" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "රුපියල් දෙදහස් පන්සියකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) (2අ) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ පවරන ලද නඩුවක දී යම් විත්තිකරුවකු විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවක් දක්වන නියෝජිතයා විසින් ඒ නඩුවේදී සටහන් කරන ලද නයිසයි තීන්දු ප්‍රකාශය ඒ විත්තිකරු වෙත භාරදීමෙන් පසුව, යම් චංචල හෝ නිශ්චල දේපළක් අන්සතු කිරීම හෝ කවරාකාර වූ හෝ ක්‍රමයකින් අන්‍යාකාරයෙන් බැහැර කිරීම, කරනු නොලැබිය යුතු ය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) යම් විත්තිකරුවකු වෙත නයිසයි තීන්දු ප්‍රකාශය භාර දීමෙන් පසු, ඔහු විසින් පහත දැක්වෙන අවස්ථාවලදී යම් චංචල හෝ නිශ්චල දේපළක් අන්සතු කිරීම හෝ කවරාකාර වූ හෝ ක්‍රමයකින් අන්‍යාකාරයෙන් බැහැර කිරීම (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකිරීමක් නොවිය යුතුය :—

(අ) නයිසයි තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල විත්තිකරු විසින් අධිකරණයට ගෙවනු ලැබ ඇති අවස්ථාවක ;

(ආ) නයිසයි තීන්දු ප්‍රකාශය සටහන් කරනු ලැබූ නඩුව නිෂ්ප්‍රභ කරන ලද්දා වූ හෝ නයිසයි තීන්දු ප්‍රකාශය නිදහස් කරන ලද්දා වූ අවස්ථාවක ;

(ඇ) නියත තීන්දු ප්‍රකාශය ප්‍රාප්ත කරන ලද අවස්ථාවක ; එසේහත් තහනමට ගෙන නියත තීන්දු ප්‍රකාශය ප්‍රාප්ත කිරීමෙහිලා යොදා නොගත් අන්සතු කරන ලද යම් දේපළ සම්බන්ධයෙන් පමණක් ; සහ

(ඈ) අධිකරණයේ අනුමතය ඇතිව සහ අධිකරණය විසින් පනවන ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත්ව අන්සතු කිරීම භාරගනු ලැබ ඇති අවස්ථාවක.

(2ආ) යම් දේපලක් ඉහතින්ම වූ විධිවිධාන කඩ කරමින් අන්සතු කරන ලද්දා වූ හෝ බැහැර කරන ලද්දා වූ හෝ අවස්ථාවක—

(අ) ඒ අන්සතු කිරීම ශූන්‍ය හා බලරහිත විය යුතු අතර, නීතියෙහි ලා බලයක් හෝ බලපෑමක් නැත්තේ ය. තව ද, ඒ දේපළ කවුරුන් සතුව තිබිය හැකි වුව ද, එය තහනමට ගනු ලැබිය හැකි විය යුතු ය :

එසේ වුව ද, ඒ දේපළ මිලට ගැනීමේ මුදල් ගෙවන අවස්ථාවේ දී හෝ පැවරුම් පත්‍රය ලියා අත්සන් කරන අවස්ථාවේ දී හෝ නයිසයි හින්දු ප්‍රකාශය ගැන දැනීමක් නොමැතිව ප්‍රතිඥාවක් සඳහා සද්භාවයෙන් ඒ දේපළ ලබා ගෙන සිටින පැවරුම්ලාභියකු අතට පත් වී ඇත්තා වූ හෝ එවැනි පැවරුම්ලාභියෙකුගෙන් වෙනත් පැවරුම්ලාභියකු අතට පත් වී ඇත්තා වූ අවස්ථාවක ඒ අන්සතු කිරීම ශූන්‍ය හා බලරහිත නොවිය යුතු අතර, දේපළ තහනමට ගනු ලැබීමට යටත් නොවිය යුතු ය ; තව ද

(ආ) දේපළ අන්සතු කරනු ලැබූ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට, රුපියල් පණස් දාහකට නොඅඩු දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඔනු යටත් විය යුතු ය.

(2ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 303 වන වගන්තියේ විධිවිධාන, (2ආ) උපවගන්තිය යටතේ බන්ධනාගාර ගතකිරීමේ දණ්ඩන නියමයක් නියමකර ඇති වරදකරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය ; " ; තව ද

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තියෙහි ඇති " (2) වන උපවගන්තියේ ඇතුළත් කිසිවක් " යන වචන හා ඉලක්කම් වෙනුවට, " (2ආ) උපවගන්තියෙහි ඇතුළත් කිසිවක් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්,

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" අභියාචනය කිරීම සඳහා අවසර දී ඇති විටෙක මුල් අධිකරණයේ නඩු කටයුතු නතර නොකළ යුතු බව.

16. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක් පවත්වාගෙන යන අතරතුර දී කරන ලද ආඥාවක් සම්බන්ධයෙන් ඉදිරිපත් කළ ඉල්ලීමක දී අභියාචනය කිරීම සඳහා අවසර දෙනු ලැබ ඇති අවස්ථාවක, මුල් අධිකරණයේ නඩු කටයුතු අභියාචනාධිකරණය අන්‍යාකාරයකින් විධාන කර

නොත් මිස, නතර නොකළ යුතු ය. තව ද අභියාචනාධිකරණය එසේ විධාන කරනු ලබන අවස්ථාවක, 6 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ අධිකරණයේ පෙනී සිට හේතු දැක්වීමට මුල් අධිකරණය විසින් ඒ අභියාචකට අවසර දී ඇත්නම් අභියාචනය නිෂ්ප්‍රභ කරනු ලබන අවස්ථාවක, ඒ පැමිණිලිකරුගේ සම්පූර්ණ හිමිකම්පෑම හෝ නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන එහි යම් කොටසක් හෝ, පියවීම සඳහා මුදලින් හෝ බැංකුකරුවකුගෙන් ලබාගත් ඇපයකින් ඇප තබන ලෙස අභියාචකට නියම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අභියාචනාධිකරණය විසින් සටහන් කරන ලද තීන්දු ප්‍රකාශය ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාවක් විය යුතු බව.

**17.** (1) නයිසයි තීන්දු ප්‍රකාශයක් නියත බවට පත් කරමින් 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනයකට, අභියාචනාධිකරණය විසින් අවසර දෙනු ලබන සහ මේ පනතේ 13 වන වගන්තිය යටතේ රිට් ආඥාවක් ක්‍රියාත්මක කරනු ලැබ ඇති අවස්ථාවක, උචිතයයි අධිකරණය සලකන යම් මුදල් ප්‍රමාණයක වූ අලාභ ප්‍රදානය කෙරෙන තීන්දු ප්‍රකාශයක් අභියාචකගේ වාසියට අභියාචනාධිකරණය විසින් සටහන් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය විසින් සටහන් කරන ලද තීන්දු ප්‍රකාශය (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර පිස්කල් වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාවක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. එහෙත්—

(අ) අභියාචනාධිකරණයේ තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අවසරය ලබාගැනීම සඳහා කිසිදු ඉල්ලීමක් අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ විශේෂ අවසරය ලබාගැනීම සඳහා කිසිදු ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ කරනු ලැබ නැති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණයට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත්වන තුරු ;

(ආ) අභියාචනාධිකරණයේ තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා වූ අවසරය අභියාචනාධිකරණය විසින් දෙනු ලබන අවස්ථාවක, හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා වූ විශේෂ අවසරය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලබන අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ අභියාචනය සම්බන්ධයෙන් තීරණයක් කරනු ලබන තුරු

ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාව ක්‍රියාවේ යෙදවීම නතර කරනු ලැබිය යුතු ය.

(3) නියත තීන්දු ප්‍රකාශයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අවසරය අභියාචනාධිකරණය විසින් දෙනු ලැබ ඇති අවස්ථාවක, මුදලින් හෝ බැංකුකරුවකුගෙන් ලබාගත් ඇපයකින්, තීන්දු ප්‍රකාශයෙන් ප්‍රකාශිත මුළු මුදල හෝ නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන ඒ මුදලින් යම් කොටසක් සඳහා ඇප තබන ලෙස අභියාචකට නියම කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයකට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සථිර කරන ලද තීන්දු ප්‍රකාශය ඉහත සඳහන් විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 225 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාර පිස්කල් වෙත යථා පරිදි නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ රිට් ආඥාවක් ලෙස සැලකිය යුතු අතර එය (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ රිට් ආඥා ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් නියමිත ආකාරයටම ක්‍රියාවේ යෙදවීම පිස්කල්ගේ කාර්යය වන්නේ ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය ඉවත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" අයවිය යුතුව ඇති මුල් මුදල ඉක්මවා පොලී අයකර ගැනීම.

**21.** මේ පනතේ හෝ වෙනත් යම් නීතියක පටිහැනිව කුමක් සඳහන්ව තිබුණ ද ආයතනයක් විසින්, මේ පනත යටතේ පවරන නඩුවක දී, මුල් මුදල ලෙස හිමිකම් කියන මුදල් ප්‍රමාණය ඉක්මවන මුදලක් පොලී වශයෙන් ඒ නඩුවේ දී අයකර ගත හැකිය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (1) වන උපවගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්—

" (අ) අරමුදල් නොමැතිවීම නිසා බැංකුවක් විසින් අගරු කරන චෙක්පත් ඇතුවත්ව ලියන ; හෝ

(ආ) ගෙවීමක් කිරීමට යම් බැංකුකරුවකුට බැඳීමක් නොමැතිවීමේ හේතුව නිසා ගෙවීම කරනු නොලබන මුදල් ප්‍රමාණයක් ගෙවීමට බැංකුකරුවකුට අණකරන හෝ කරන ලද අණ වංචා චේතනාවෙන් පසුව ප්‍රතිනියෝගයට යටත් කරන ; හෝ " ; සහ

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇ) දේශීය බිල්පත්‍රයක් භාරගෙන, එය ගෙවීම වංචාව ප්‍රතික්ෂේප කරන ; ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 25අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

**25අ.** මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන ලද අවස්ථාවක:—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක්, කළමනාකාරවරයෙක්, හෝ ලේකම්වරයෙක් ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ; සහ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකළ මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයෙක්ම

ඒ වරදට වරදකරු වන්නේ ය :

එසේ වුව ද, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙක්, හෝ කළමනාකාරවරයෙක් හෝ ලේකම්වරයෙක් හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවෙකු, ඒ වරද කරන ලද්දේ ඔහුගේ දැනීමක් නොමැතිව හෝ ඔහු, ඒ වරද කිරීම වලක්වාලීමෙහිලා නිසි උද්යෝගයෙන් ක්‍රියාකර ඇති බව හෝ ඔප්පු කළ හොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සළකනු නොලැබිය යුතු ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) “ණය මුදල” යන වචනයේ අර්ථ කථනයට පෙරාතුව ම, මෙහි පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුලත් කිරීමෙන්—

“භාරදීමේ සටහන” යන්නෙන්,—

දේශීය තැපැල් (ලියාපදිංචි භාණ්ඩ හා රක්ෂණය කළ භාණ්ඩ) රීතිවල 9 (ආ) රීතිය යටතේ නිකුත් කරන ලද භාරදීමේ සටහන අදහස් වේ;”;

(2) “ණය මුදල” යන වචනයේ අර්ථ කථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

“ණය මුදල” යන්නෙන්, නඩුව පවරන වේලාවේ දී නිශ්චය වශයෙන් දැනගෙන ඇත්තාවූ හෝ නිශ්චය වශයෙන් දැනගැනීමට පුළුවන්වූ ද ගෙවීම පැහැර හරිනු ලැබ ඇත්තාවූ ද ඇපයක් ඇතිව හෝ නැතිව දෙන ලද්දවූ ද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් හවුලේ හෝ තනි තනිව හෝ නැතහොත් ප්‍රධාන ණයකරු වශයෙන් හෝ ඇප කරු වශයෙන් හෝ වෙනත් යම් තත්ත්වයකින් හෝ ගෙවිය යුතු වන්නාවූ ද, ණය දෙන ආයතන යක බැංකු කටයුත්තක් ණය දීමේ කටයුත්තක්, මූදල් කටයුත්තක් හෝ ඒ ආයතනයේ වෙනත් ඊට සමාන ව්‍යාපාර කටයුත්තක් හා සම්බන්ධ ගණු දෙනුවක් නිසා ඇති වූ බව ඒ ආයතනය විසින් කියා සිටිනු ලබන්නාවූ ද මුදල් ප්‍රමාණයක් අදහස් වන අතර, ලියවිල්ලක් මගින් නොවූ පොරොන්දු වක් හෝ එකඟවීමක් යටතේ ගෙවිය යුතුව ඇති මුදල් ප්‍රමාණයක් ඊට ඇතුළත් නොවේ;”;

(3) “ණය දෙන ආයතනය” යන යෙදුමේ අර්ථකථනයේ (ඊ) ඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඊ) 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ මුදල් සැපයීමේ ව්‍යාපාරය කරගෙන යාම සඳහා ලියාපදිංචි කරන ලද සමාගමක්,

අදහස් වන අතර එයට, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පත් කරන ලද ඈවරකරුවෙක් හෝ ඉහත සඳහන් කරන ලද යම් බැංකුවක, සංස්ථාවක, හෝ සමාගමක ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා හෝ එය ගණුදෙනු බේරා වසාදැමීම සඳහා හෝ යථාපරිදි පත් කරන ලද යම් බලධරයෙක් ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

"පළමුවන උපලේඛනය [4(2) වගන්තිය]

**නඩිසයි තීන්දු ප්‍රකාශයේ ආකෘතිය**

**(ශීර්ෂ පාඨය)**

19 මස වන දින (විනිශ්චයකාරවරයාගේ නම සහ ධුරය) ඉදිරිපිට මේ නඩුව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබ, පැමිණිල්ල සහ ලේඛන කියවා බැලීමෙන් ද ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ අඩංගු සම්ප්‍රකාශ ගැන සෑහීමට පත් වීමෙන් ද පසු අයකර තීන්දු ප්‍රකාශ කරන වගනම්, රු............ ක මුදලක් ද .........සිට............දක්වා සියයට...........ගණනේ පොලිය ද ඊට පසු මෙහි දිනයේ සිට මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් එම අනුපාතිකය මතම පොලිය ද නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බව ය.

ඉහත නම සඳහන්.........ගේ ගෙවල්, ඉඩම්, භාණ්ඩ ණය සහ අයවිය යුතු ණය තහනමට ගෙන අවශ්‍ය නම් ඒවා විකිණීමෙන් අධිකරණයේ මේ තීන්දු ප්‍රකාශය මගින්...........ට විරුද්ධව පැමිණිලිකරු විසින් අයකර ගෙන ඇති මුදල ලබා ගන්නා ලෙසද මේ නඩිසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කිරීමෙන් දින තිහක් ඇතුළත හෝ මේ අධිකරණය විසින් ඉඩදෙන යම් දීර්ඝ කරන ලද කාලයක් ඇතුළත ඒ මුදල මේ අධිකරණය ඉදිරියට ගෙනෙන ලෙසද...........පළාතේ ෆිස්කල් විසින් ඒ ඒ දේපළ විකුණූ මුදල හෝ මුදල් සහ තැනැත්තා හෝ තැනැත්තන් පිළිවෙලින් මේ අධිකරණයට දක්වන ලෙසද...........පළාතේ ෆිස්කල්ට මෙයින් අණකරනු ලැබේ. මේ නඩිසයි තීන්දු ප්‍රකාශය නියත බවට පත් කළ පසු එය එම කාර්යය සඳහා අණපත්‍රයක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය.

තවද 19......මස......වන දින...... (වේලාව) මෙම අධිකරණය ඉදිරියෙහි පෙනී සිටින ලෙසත් මේ නඩිසයි තීන්දු ප්‍රකාශය නියත තීන්දු ප්‍රකාශයක් බවට පත් නොකිරීමට හේතු තිබීමක් ඇත්නම් ඒ හේතු දක්වන ලෙසත් එහි ඉහත කී ............ විත්තිකරු වන ඔබට මෙයින් නියම කරනු ලැබේ.

අත්සන් තැබූ ..............(විනිශ්චයකාරවරයාගේ නම සහ ධුරය) 19 ........... මස........... වන දින දී ය.".

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තු විවාද සිංහල පිටපත් කාණ්ඩවල සහ පිටපත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,100 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් එවා පසුව එළඹෙන ඒ ඒ වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය